PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

2022-07-14

දේශපාලන පක්ෂ නායකයින් හා

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත,

<u>බෙදීම් ඇතිවන කිසිදු ක්‍රියාමාර්ගයක් නොගනිමු.</u>

<u>සාමූහික එකඟතාවයකින් ජනපති අගමැති තෝරමු.</u>

මේ මොහොතේ ශ්‍රී ලංකාව පත්ව ඇති ආර්ථික, දේශපාලන හා සමාජ අස්ථාවරභාවය පිළිබඳව හා එම තත්ත්වය වෙනස් කිරීම සඳහා දේශපාලන පක්ෂ නායකයින් හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙස ඔබට ඇති අත්හල නොහැකි වගකීම මෙතෙක් තේරුම් නොගත් මහජන නියෝජිතයින් සිටින බව ඔවුන්ගේ හැසිරීම් වලින් පැහැදිලිවේ.

මේ මොහොතේ අප සියලුම දෙනා එක්ව කටයුතු නොකලහොත් දේශපාලකයින් වන ඔබ හා පුරවැසියන් වන අප හැම විනාශය කරා ඇදීයාම වැළැක්වීමට කිසිවකුට නොහැකි වනු ඇත. ඉදිරි කාලය තුළ කවුරුන් රාජ්‍ය පාලනය ලබාගත්තද ජනප්‍රිය නොවන තීන්දු ගැනීමට සිදුවන අතර පුරවැසියන් වන අප ඍජුව මෙම ව්‍යසනයට වගනොකිවයුතු වුවද පුරවැසියන්ටද විශාල කැපකිරීමක් සිදුකිරීමට සිදුවනු ඇත.

එබැවින් ජනාධිපතිවරයා හා අග්‍රාමාත්‍යවරයා තෝරාගැනීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි පක්ෂ නායකයින් හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ඔබ සියලු දෙනාගේම අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටිමු.

1. අන්තර්කාලීන ආණ්ඩුවේ ජනාධිපතිවරයා හා අගමැතිවරයා තෝරාගැනීමේදී දේශපාලන පක්ෂ සියල්ල සමග එකඟතාවයකින් තෝරාගත යුතුය. කිසිදු හේතුවක් මත ඒ සඳහා ඡන්ද විමසීමකට යාමෙන් වළකින්න.

2. එසේ තෝරාගැනීමේදී ඒ ඒ දේශපාලන පක්ෂවලට පාර්ලිමේන්තුවේ ඇති සංඛ්‍යාත්මක බහුතරය පමණක් සලකාබැලීමෙන් වළකින්න.

3. දේශපාලන පක්ෂ අතර කිසිදු භේදයක්, නොඑකඟතාවයක් ඇතිවන ආකාරයේ කටයුතු කිරීමෙන් හා අදහස් ප්‍රකාශ කිරීමෙන් වළකින්න.

4. පෞද්ගලික න්‍යාය පත්‍ර, දේශපාලන න්‍යායපත්‍ර හෝ පටු පක්ෂ/බල න්‍යායපත්‍ර පසෙක තබා රටත් ජනතාවත් ප්‍රමුඛත්වයෙහිලා කටයුතු කරන්න.

5. ඉදිරි මැතිවරණ ඉලක්ක කරගනිමින් මේ අසීරු මොහොතේ තීරණ ගැනීමෙන් වළකින්න.

6. ඉදිරි කැබිනට් මණ්ඩලය තෝරාගැනීමේදී පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම පක්ෂවලින් එක් අයෙකු හෝ ඇතුළත් කරගැනීමට වගබලාගන්න.

7. එමෙන්ම කැබිනට් මණ්ඩලය තෝරාගැනීමේදී ඇති ආර්ථික, සමාජ හා දේශපාලන අර්බුද විසඳීමට හා අන්තර්ජාතික තත්ත්වයන් කළමණාකරණය කරගැනීමට සාධනීය දායකත්වයක් ලබදිය හැකි ජනතාවගේ අප්‍රසාදයට පත්නොවූ අය තෝරාගැනීමට වගබලාගන්න.

8. සර්ව පාක්ෂික ආණ්ඩුවක ජනාධිපතිවරයා හෝ අගමැතිවරයා කැබිනට් අමාත්‍ය ධුරයකට ඔබට ආරාධනා කලහොත් එය ප්‍රතික්ෂේප කිරීමෙන් වළකින්න.

#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.
Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572
Email : paffrel@sltnet.lk Web : www.paffrel.com

ඉහත කරුණු පිළිබඳව සියලුම දේශපාලන පක්ෂවල අවධානය යොමුවිය යුතු බවට අප විශ්වාස කරමු. එමෙන්ම කැබිනට් මණ්ඩලය තෝරාපත්කරගැනීමේදී සාම්ප්‍රදායික බවෙන් මිදුනු අර්බුද කළමණාකරණය පිළිබඳව පරිචයක් ඇති අවදානම ගැනීමට සූදානම්, නිර්මාණශීලී කණ්ඩායමක් තෝරාගැනීම කෙරෙහි දේශපාලන පක්ෂවල අවධානය යොමුවිය යුතුය.

එසේ නොවුනහොත් පවතින අර්බුදය තවත් තීව්‍ර වී රට නැවත ගොඩගැනීමට නොහැකි විශාල අර්බුදයක් කරා යෑම කිසිවෙකුටත් නොවැළැක්විය හැකිවනු ඇත.



රෝහණ හෙට්ටිආරච්චි

විධායක අධ්‍යක්ෂ

2022.07.14

To Leaders of all Political Parties and Honorable Members of Parliament

## Let's not adopt any divisive measures

## Let's elect the President and Prime Minister by consensus

The conduct of some public representatives indicates that there are some who have still not realized the severity of the present economic, political and social instability facing Sri Lanka and the inalienable obligation they have, as political party leaders and parliamentarians, in overcoming this situation.

If we all do not work together at this moment, no one will be able to prevent you, the politicians, and us, the citizens, from plunging into a catastrophic disaster. Whoever will be elected to the power to govern the country in the future, will certainly be compelled to make unpopular decisions, and even we, the citizens too, will have to make great sacrifices though we are not directly responsible for this adversity.

Therefore, we kindly request all of you, the party leaders and Members of Parliament, to focus your attention to the following points in selecting a new President and a Prime Minister.

1. The President and the Prime Minister of the proposed Interim Government should be elected by the consensus of all political parties, and prevent conducting a poll in doing so, under any circumstances.

2. Avoid considering only the numerical majority of the respective political parties in the parliament in this exercise.

3. Prevent from all actions and expressing opinions that may cause division or discord among political parties.

4. Put aside all personal agendas, political agendas or narrow party/power agendas and always put the priority on the country and the people.

5. Avoid making decisions targeting upcoming elections, at this difficult time

#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.
Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572
Email : paffrel@sltnet.lk Web : www.paffrel.com

6. Ensure that at least one person from each political party or group represented in Parliament are included when selecting the next Cabinet.

7. Make sure that the people who can make a positive contribution towards solving the economic, social and political crises facing the country, and are capable of managing the international situation are only given priority when electing the Cabinet. Also refrain from appointing anyone who has become a victim of public displeasure.

8. Do not decline the request if the President or Prime Minister of the forthcoming all-party government extends an invitation to you to be a Cabinet Minister.

We firmly believe that all political parties should pay their attention to the above matters. Also, when selecting the Cabinet, the political parties should pay their particular attention on appointing a team that is innovative, free from conventionality, experienced in crisis management, and is prepared to take risks are taken into account.

Otherwise, it is inevitable that the current crisis will be intensified further and plunge the country into a worse predicament that it would not be possible for the country to recover and restore easily.

Rohana Hettiarachi

Executive Director